සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Department of Education, Southern Province

29 | S | I

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**

கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்

**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

**12 ශ්‍රේණිය**
**Grade 12**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I**
**Communication and Media Studies - I**

**පැය දෙකයි**
**Two hours**

විභාග අංකය :- ..............................

**සැලකිය යුතුයි :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා ගෙන එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදන්න.**

(01) සිංහලයේ සන්නිවේදනය යන වචනය සං + නි + විද් වේදනය යනුවෙන් සකස් වී ඇත. එහි අර්ථය **''මැනවින් දැන ගැනීම''** යන්නයි. සන්නිවේදනයේ ස්වභාවයක් වන්නේ,

1. සංකේතාත්මක වීම යි.
2. විනෝදාස්වාද සම්පාදනය යි.
3. උපදෙස් සම්පාදනය යි.
4. පෙළඹවීම යි.
5. සුපරීක්ෂණය යි.

(02) සන්නිවේදනයේ ආරම්භය පිළිබඳ නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. 15 වන සියවසේ දී මුද්‍රණ යන්ත්‍රය බිහිවීමත් සමඟ සිදුවිය.
2. මිනිසා මිහිමත ජීවත් වීම ආරම්භ කළ දිනයේ සිට සිදුවිය.
3. ගෝත්‍රික සමාජ බිහි වූ දා සිට සිදුවිය.
4. වැඩවසම් සමාජය බිහි වූ දා සිට සිදුවිය.
5. කාර්මික විප්ලවයෙන් පසුව සිදුවිය.

(03) සන්නිවේදන විෂය සන්නිවේදන අධ්‍යයනය නමින් ස්වාධීන විෂය ක්ෂේත්‍රයක් ලෙස හැඳින්වීමට පෙර ප්‍රධාන විෂය ක්ෂේත්‍ර තුනක් යටතේ ගොඩනැගුනි ඒවා වන්නේ,

1. තොරතුරු තාක්ෂණය, ආර්ථික විද්‍යාව, මනෝවිද්‍යාව
2. මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව, දේහපාලන විද්‍යාව
3. දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව
4. තර්ක ශාස්ත්‍රය, සමාජ විද්‍යාව, මානව විද්‍යාව
5. මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව, භෞතික විද්‍යාව

(04) ''ජනමතය'' යන කෘතිය 1922 දී රචනා කරමින් සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය සංවර්ධනය කළේ,

1. චාල්ස් කුලි
2. විල්බර් ශ්‍රාම්
3. වෝල්ටර් ලිප්මාන්
4. ජෝන් ඩුවී
5. හැරල්ඩ් ලැස්වෙල්

(05) සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් ලෙස අධ්‍යයනය කිරීමට දායක **නොවූයේ,**

1. හැරල්ඩ් ලැස්වෙල්
2. කර්ට් ලෙබින්
3. පොල්ලැසාස්ෆෙල්ඩ්
4. ඒබ්‍රහම් ලින්කන්
5. කාල් හවුලන්ඩ්

(06) සන්නිවේදන මූලිකාංගවලට අයත් වන වරණය සහිත පිළිතුර වන්නේ,

1. සන්නිවේදක, ආකේතකරණය, පෙළඹවීම, සංකේත
2. සංකේත, සංදේශය, ග්‍රාහකයා, විකේතකරණය
3. සන්නිවේදක, සංදේශය, අත්දැකීම් පසුතලය, බලපෑම
4. විකේතකරය, බලපෑම, අර්ථකථනය, සුපරීක්ෂණය
5. අත්දැකීම් පසුතලය, නාලිය, ප්‍රතිපෝෂණය, ඝෝෂාව

(07) සන්නිවේදන විෂය කැළණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය යනුවෙන් ආරම්භ කරන ලද්දේ,

1. 1973 වසරේ දී ය
2. 1971 වසරේ දී ය
3. 1968 වසරේ දී ය
4. 1982 වසරේ දී ය
5. 1950 වසරේ දී ය

(08) **''පුවත්පත් කලාව''** යනුවෙන් ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කළ විශ්වවිද්‍යාලය වූයේ,

1. කැලණිය වි. වි
2. කොළඹ වි. වි
3. දෙහිවල කණිෂ්ඨ වි.වි
4. ශ්‍රී ජයවර්ධනපුර වි.වි
5. පේරාදෙණිය වි.වි.

(09) ග්‍රෑන්වල්ඩ් ප්‍රකාශනය (Grunwald Declaration) හඳුන්වා දුන්නේ,

1. යුනිසෙෆ් ආයතනය විසිනි
2. ඉලිනොයිස් විශ්වවිද්‍යාලය විසිනි
3. යුනෙස්කෝ සංවිධානය විසිනි
4. හාවර්ඩ් විශ්වවිද්‍යාලය විසිනි
5. ලෝක බැංකුව විසිනි

- **අංක 10 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවලය පිළිතුරු වගුව ඇසුරින් සපයන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| සන්නිවේදක | A | අර්ථකථනය | B | සංඥා | C |
| සංදේශය | D | අග්‍රස්ථය | E | දොරටු පාලක | F |
| ග්‍රාහකයා | G | ඝෝෂාව | H | බලපෑම | I |
| ප්‍රතිපෝෂණය | J | **සම්ප්‍රේෂණය** | K | මාධ්‍ය | L |

(10) විල්බර් ශ්‍රාම්ගේ සන්නිවේදන ආකෘතියේ අන්තර්ගත අංග ඇතුළත් වරණය වන්නේ,

1. A, B, C
2. A, D, G
3. A, H, E
4. A, I, L
5. A, G, C

(11) **HUB ආකෘතිය** ගලායාමට අදාළ වන අංග ඇතුළත් වන්නේ,

1. A D G J E I
2. D A H L I
3. C B D A G I
4. A C F L G I
5. A D C H L G

(12) සන්නිවේදන ක්‍රියාවලිය චක්‍රිය වීමට අදාළ අංග ඇතුළත් වරණය වන්නේ,

1. A B G J 2. A D G E 3. A D G J
4. A C G I 5. A B C D

(13) සන්නිවේදක ලබා දෙන සංදේශය ඒ ආකාරයෙන්ම ග්‍රහක ගත විය නොහැක. එය නිරූපණය වන්නේ,

1. J 2. B 3. I
4. L 5. H

(14) "ADKHG" යන අංග ඇතුළත් සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ,

1. ෂැනොන් සහ වීවර් ය
2. විල්බර් ශ්‍රාම් ය
3. හැරල්ඩ් ලැස්වෙල් ය
4. ශ්‍රාම් බස්ගුඩ් ය
5. හර්බට් උන්ගුරයිඩ් හා බොන් ය

(15) I අක්ෂරයෙන් දක්වනෙ අංගය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් තම ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ,

1. විල්බර් ශ්‍රාම් ය
2. ඩේවිඩ් කේ බර්ලෝ ය
3. ෂැනොන් සහ වීවර් ය
4. හැරල්ඩ් ලැස්වෙල් ය
5. හර්බට් උන්ගුරයිට් හා බොන් ය

(16) සන්නිවේදනයේ ප්‍රධාන අරමුණ වන්නේ,

1. මානව අන්තර් සම්බන්ධතා ගොඩනැගීම යි
2. සන්නිවේදන ක්‍රියාවලියට අවශ්‍ය තාක්ෂණය ගොඩනැගීම යි
3. මානව අත්දැකීම්වල කේන්ද්‍රීය සාධකය සන්නිවේදනය බව පෙන්වීම යි
4. සංදේශ නිර්මාණය හා හුවමාරු ක්‍රම පෙන්වීම යි
5. ජනමාධ්‍ය වර්ධනය වූ ආකාරය පෙන්වීම යි

(17) ''**සන්නිවේදනය වූකලි බලයකි**'' මෙහි අදහස වන්නේ,

1. සන්නිවේදනය සන්දර්භයානුගතව ක්‍රියාත්මක වීම යි.
2. සන්නිවේදනය හුදෙකලා නොවූ ක්‍රියාපටිපාටියක් වීම යි.
3. සන්නිවේදනය ඒකමාර්ගික හා ද්විමාර්ගික ස්වභාවයක් තුළ සිදුවීම.
4. සන්නිවේදනයේ බලය විවිධ ප්‍රභේද හා ස්වරූපවලින් ක්‍රියාත්මක වීම
5. සන්නිවේදනය මඟින් බලයේ පදනම වූ දැනුම නිර්මාණය කිරීම යි.

(18) අථත්‍ය සන්නිවේදනය සම්බන්ධ නිරවද්‍ය ප්‍රකාශය ඇතුළත් වරණය වන්නේ,

1. වෘත්තීය සන්නිවේදකයක් යාන්ත්‍රික මාධ්‍ය ඉවහල් කර ගෙන කරන සන්නිවේදනයකි.
2. එකවර පුද්ගලයින් රැසක් සමඟ සන්නිවේදනයේ යෙදෙන නමුත් භෞතික ඉඩකඩ අවශ්‍ය නොවීමකි
3. ඉලක්ක ග්‍රාහක පිරිසෙන් ඔබ්බට විශාල සමූහයකට තොරතුරු ලබා දිය නොහැකි සන්නිවේදනයකි.
4. ග්‍රාහක කේන්ද්‍රීය බව සෑම විටම දැකිය හැකි සන්නිවේදන ක්‍රියාවලියකි
5. මානව චර්යා හා ඉරියව් අනුව ඇතැම් අවස්ථාවල තීරණ ගත හැකි සන්නිවේදන ක්‍රියාවලියකි.

(19) තිඹිරි ගෙයින් ආරම්භ වී රන්සිවි ගෙය දක්වා ගෙවෙන ක්‍රියාවලිය

1. අධ්‍යාපනය යි 2. සෞඛ්‍යය යි 3. දේශපාලනය යි
4. විනෝදාස්වාදය යි 5. සන්නිවේදනය යි

The National e-Learning Portal for the General Education

(20) ජනමාධ්‍ය ඉටු කළ යුතු භූමිකා කීපයක් පහත දැක්වේ.

A - ආරක්ෂකයෙකුගේ භූමිකාව

B - සාකච්ඡා මණ්ඩපයක භූමිකාව

C - පරිසරය ආරක්ෂාකර ගැනීමට රුකුල් දීම

D - සමාජ උරුමය අඛණ්ඩව ව්‍යාප්ත කිරීම

E - ගුරුවරයෙකුගේ භූමිකාව

විල්බර් ශ්‍රාම් ජනමාධ්‍ය මඟින් ඉටු කළ යුතු කාර්යයන් ලෙස දැක්වූයේ,

1. C D හා E ය. 2. D E හා A ය. 3. A B හා E ය.

4. B C හා D ය. 5. A E හා C ය.

(21) ''එදිනෙදා ජීවිතයට අවශ්‍ය තොරතුරු සහිත යම් නිශ්චිත කාල වකවානුවක අඛණ්ඩව ප්‍රකාශයට පත්කර එකවර නොබඳින ලද ප්‍රකාශනය පුවත්පත වේ'' මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,

1. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය 2. යුනෙස්කෝ ආයතනය

3. එඩ්වින් එමලි 4. ජෝසප් පුලිට්සර්

5. පොල් ඩී මැසනරීස්

(22) ලෝක ව්‍යාප්ත ජාලය පිළිබඳ (W.W.W.) අදහස ඉදිරිපත් කළේ,

1. ජොන් මිල්ටන් විසිනි 2. මාෂල් මැක්ලුහන් විසිනි 3. ටිම් බර්නස් ලී විසිනි

4. බර්නාඩ් ස්ටෙන්ලර් විසිනි 5. මැනුවෙල් කැස්ටෙල් විසිනි

The National e-learning Portal for The General Education

(23) වාචික සන්නිවේදන නිපුණතා පිළිබඳව අවම වැදගත්කමක් ඇත්තේ,

1. වාග් කෝෂය පුළුල් කර ගැනීම

2. තමා සතු අදහස් හා තොරතුරු ඇතුළත් දැනුම වර්ධනය

3. වගකීමෙන් යුතුව වචන භාවිතය

4. සූදානමකින් තොරව ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කිරීම

5. පෞද්ගලික අනන්‍යතාවයක් හා ස්වීයත්වයක් ගොඩනගා ගැනීම

(24) දේහ භාෂාව ප්‍රකට වන අංග ලක්ෂණ ඇතුළත් වරණය වන්නේ,

1. සිනහව, ශබ්ද, සංඥා, කාටූන්, ඇඳුම් පැලඳුම්

2. ආභූෂණය, ස්පර්ශය, දෘශ්‍ය සංඥා, ශ්‍රව්‍ය සංඥා, ආලෝකය

3. වර්ණ, බෙරහඬ, චිත්‍ර, සිනහව, කඳුළු

4. අංග චලන, ශරීරයේ පෙනුම, උපකරණ, සිතියම්, වර්ණ

5. මුහුණේ ඉරියව්, අංග චලන, ඇස්සබඳතා, ඇඳුම් පැලඳුම්, පාර භාෂා

(25) කථන සන්නිවේදනය පිළිබඳ අවම වැදගත් කමක් ඇත්තේ,

1. එය නිරායාසයෙන් සිදුවීම

2. ස්වාභාවික ක්‍රියාවලියක් වීම

3. නිර්වාචික සන්නිවේදනය යොදා ගත නොහැකි වීම

4. ග්‍රාහකයා අනුව වචන තෝරාගත හැකි වීම

5. සන්නිවේදකයා සෑම විටම ශාරීරිකව පෙනී සිටීම

(26) දෘශ්‍ය සන්නිවේදන ක්‍රමයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

1. පාරභාෂාව, ආග්‍රහණය, දුර හා සමීප බව
2. ගින්දර, දුම, කොළ අතු
3. කැටයම්, මූර්ති, ප්‍රතිමා
4. සිනමාව, චිත්‍ර, කාටූන්
5. පෝස්ටර්, රූප සටහන්, ඡායාරූප

(27) සන්නිවේදනය සංකේතාත්මක වේ. ඒ පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් සදොස් වන්නේ,

1. සංකේත සංඥා ඇසුරෙන් ගොඩනැගේ.
2. සංකේත වෙනත් යමක් වෙනුවෙන් පෙනී සිටී
3. එකම සංකේතය සන්දර්භය අනුව වෙනස් වේ.
4. සංකේත භාවිතය සියලුම සත්වයන්ට කළ හැකි කාර්යයකි.
5. සංකේත තෝරා ගැනීම දුර්වල වුවහොත් සංදේශ ව්‍යාකූලවේ.

(28) එකම ස්ථානයක විසිරී සිටින සමූහය ඉක්ම වූ විශාල පිරිසක් වෙත විවිධ තාක්ෂණික උපකරණ සංචිතයෙන් සිදුකරන සන්නිවේදනය

1. අන්තර්පුද්ගල සන්නිවේදනය
2. සමූහ සන්නිවේදනය
3. මහජන සන්නිවේදනය
4. ජන සන්නිවේදනය
5. නව මාධ්‍ය සන්නිවේදනය

(29) සාම්ප්‍රදායික මාධ්‍ය අන්තර්ගතයක ඇති ලක්ෂණයක් නොවන්නේ,

1. සරල ආකෘතියකින් යුක්ත වීම
2. විධිමත් ධාරාවන්ගෙන් යුක්ත වීම
3. නම්‍යශීලී බව
4. පිරිවැය අවම වීම
5. සංස්කෘතික සම්බන්ධතාවයක් පැවතීම

(30) පන්ති කාමරයේ සිටි සිසුන් විවිධ සන්නිවේදන ප්‍රභේද පිළිබඳව සාකච්ඡාවක නිරත විය. ඔවුන් දැක්වූ අදහස් කීපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| කමල් | : | විනෝදාස්වාදය සඳහා යොදාගත හැකිය. |
| අමල් | : | හැඟීම් පළ කිරීමට වඩාත් සුදුසුය. |
| නිමල් | : | සංස්කෘතිකාංග හුවමාරුවට යෝග්‍ය වේ |
| ඉෂිනි | : | දැනුම් ඉගෙනුම් සම්පාදනය කළ හැකිය. |
| තරුෂි | : | උපදේශාත්මක සංදේශ ජනනය කළ හැකි වීම |

ඉහත ප්‍රකාශ අතුරින් **සාම්ප්‍රදායික** සන්නිවේදනයේ වැදගත්කමට වඩාත් යෝග්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,

1. කමල්, අමල්, නිමල් නිවරදි වන අතර ඉෂිනි තරුෂි වැරදිවේ.
2. කමල්, ඉෂිනි, තරුෂි නිවරදි වන අතර අමල්, නිමල් වැරදි වේ.
3. කමල්, අමල්, ඉෂිනි නිවරදි වන අතර නිමල්, තරුෂි, වැරදි වේ.
4. කමල්, අමල්, නිමල්, ඉෂිනි, තරුෂි සියලු දෙනා නිවැරදි ය.
5. කමල්, අමල්, නිමල්, ඉෂිනි, තරුෂි සියලු දෙනා වැරදිය.

(31) දොරටුපාල ක්‍රියාවලියේ දක්නට ලැබෙන වැදගත් ලක්ෂණයක් වන්නේ,

1. තොරතුරු අතිශෝක්තියට ලක් කිරීමයි.
2. තොරතුරු අල්පෝක්තියට ලක් කිරීමයි.
3. තොරතුරු විකෘති කිරීමයි.
4. තොරතුරුවලට සළු පිළි ඇන්ද වීමයි.
5. තොරතුරු පාලනය කිරීම හා බෙදා හැරීමයි.

(32) සමාජ මාධ්‍යයක කාර්යය භාරයන් අතර වඩාත් වැදගත් ලක්ෂණයක් වන්නේ,

1. අන්තර්ජාලය විවිධ තොරතුරු, නිර්මාණය බෙදා හදා ගත හැකි වීම
2. පෞද්ගලික තොරතුරු ඉදිරිපත් කළ හැකි වීම
3. තම මතය තහවුරු කර සමාජ මත වෙනස් කිරීම
4. ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා සමාජය පොළඹවා ගැනීම
5. තම වෙළඳ සන්නාමය ප්‍රවර්ධනය කර ගත හැකි වීම

(33) Twiter යනු සමාජ ජාල හා සූක්ෂම Blogs සේවාවකි. මෙහි විශේෂත්වය වන්නේ,

1. මෙමගින් ඡායාරූප හුවමාරු කිරීමට පහසු වීම
2. වීඩියෝ ඇමතුම් හා කණ්ඩායම් සම්මන්ත්‍රණ සිදු කළ හැකි වීම
3. ව්‍යාපාරික ප්‍රජාව අරමුණ කරගෙන ගොඩ නැගීම
4. පණිවිඩයක අකුරු 140 සීමාවීම
5. ජනප්‍රිය නිදහස් සමාජ ජාලයක් වීම

(34) පහත සඳහන් සන්නිවේදන අවස්ථාවන්හි දී බොහෝ දෙනෙකුට සම්බන්ධ විය හැකි සමාජ මාධ්‍ය වන්නේ,

* හැඟීම් අදහස් ප්‍රකාශ කිරීම
* පිළිසඳරේ යෙදීම
* පෞද්ගලික පණිවිඩ හුවමාරු කර ගැනීම
* ජීවන සිදුවීම් ඉදිරිපත් කිරීම හා ඒවාට ආරාධනා කිරීම
* පොදු අදහස් ඇති අය එකතු වී කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීම

1. Twiter  2. Instagram  3. Face book
4. Skype  5. Linkiedin

(35) සන්නිවේදන ප්‍රභේද පමණක් අන්තර්ගත වන වරණය වන්නේ,

1. කථන, ලිඛිත, ශ්‍රව්‍ය, අන්තර්වර්තී සන්නිවේදනය යි.
2. අන්තර්පුද්ගල, සමූහ, අථත්‍ය, වාචික සන්නිවේදනය යි
3. අන්තර්වර්තී, මහජන, දෘෂ්‍ය, ශ්‍රව්‍ය, සන්නිවේදනය යි.
4. ජන සන්නිවේදනය, වාචික, නිර්වාචික, ලිඛිත සන්නිවේදනය යි
5. අන්තර්වර්තී, අන්තර් පුද්ගල, කණ්ඩායම්, අථත්‍ය සන්නිවේදනය යි

(36) සමූහ සන්නිවේදනයේ ලක්ෂණයක් නොවන්නේ,

1. පුද්ගලයින් පිරිසක් හෝ කණ්ඩායමක් සම්බන්ධ වීම
2. කණ්ඩායම් නායකත්වය ඉස්මතු වීම
3. තාක්ෂණික මෙවලම් අනිවාර්ය වීම
4. නිශ්චිත අරමුණකට අනුව සිදුවීම
5. සහභාගී වන පිරිසගෙන් අදහස් හා යෝජනා ලබා ගත හැකි වීම.

e-තක්සලාව TM The National e-learning Portal for the General Education

(37) ''වෘත්තීය සන්නිවේදකයන් යාන්ත්‍රික මාධ්‍ය වහල් කොටගෙන පුළුල් ලෙසත්, ක්ෂණිකවත්, අඛණ්ඩවත්, සංදේශ විශාල වූත් විවිධ වූත් ග්‍රාහක ක්ෂේත්‍රයක් වෙත පතුරුවමින් යම් බලපෑමක් ඇති කිරීමේ ක්‍රියාවලිය කුමක් ද?

1. මහජන සන්නිවේදනය
2. සමූහ සන්නිවේදනය
3. කණ්ඩායම් සන්නිවේදනය
4. පුද්ගලාන්තර සන්නිවේදනය
5. ජන සන්නිවේදනය

(38) අන්තර් පුද්ගල සන්නිවේදනය තුළ **අවම** වැදගත් කමක් ඇති ප්‍රකාශය වන්නේ,

1. ප්‍රතිපෝෂණය නොසලකා හැරීම
2. මුහුණට මුහුණලා සන්නිවේදනයේ යෙදීමේ හැකියාව
3. වාචික මෙන්ම අවාචික සන්නිවේදන විධි භාවිතය
4. බාධක අවම කරගත හැකි වීම
5. සන්නිවේදක ග්‍රාහක භූමිකා හුවමාරුව සිදුවීම

(39) **ප්‍රදීපාගාර උපක්‍රමය** යොදා ගන්නා සන්නිවේදන ප්‍රභේදය වන්නේ,

1. අර්ථාන්‍ය සන්නිවේදනය
2. ජන සන්නිවේදනය
3. අන්තර් පුද්ගල සන්නිවේදනය
4. මහජන සන්නිවේදනය
5. සමූහ සන්නිවේදනය

(40) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක රාජ්‍ය මාධ්‍ය ආයතනයක් වන්නේ,

1. විජය පුවත්පත් ආයතනය
2. ලේක්හවුස් ආයතනය
3. මහාරාජා ආයතනය
4. පදනම් ආයතනය
5. ABC මාධ්‍ය ආයතනය

(41) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්‍රියාවලිය ආරම්භ වූයේ,

1. ක්‍රි.ව. 10 සියවසේ දී ය
2. නිදහස ලැබීමෙන් පසු යුගයේ දී ය
3. ක්‍රි.ව. 15 සියවසේ දීය
4. 20 වන සියවසේ අග භාගයේ දී ය
5. යටත් විජිත සමයේ දී ය

(42) සන්නිවේදනය විෂය ආරම්භ කිරීමේ දී බාහිර කථිකාචාර්යවරු ලෙස සම්බන්ධ නොවූ අයෙකු වූයේ,

1. පියසෝම මේදිස්
2. එඩ්වින් ආරියදාස
3. ඩී. බී. නිහාල්සිංහ
4. ආරියරත්න ඇතුගල
5. කේ. ජයතිලක

(43) ශ්‍රී ලංකාවේ මුද්‍රණය කළ ප්‍රථම ලියාපදිංචි සිංහල පුවත්පත කුමක් ද?

1. ලක්මිණිපහන
2. ලංකාලෝකය
3. ඥානාර්ථ ප්‍රදීපය
4. සරසවි සඳරැස
5. සිංහල බෞද්ධයා

The National e-Learning Portal for The General Education

(44) ජන සන්නිවේදන ක්‍රියාවලියේ දී සන්නිවේදකයෝ, සංඥා, දොරටු පාලකයෝ, ජනමාධ්‍ය හා පෙරහණු ආදිය ඇතුළත් ආකෘතිය වන්නේ,

1. ෂැනොන් වීවර් ආකෘතිය යි
2. ලැස්වෙල් ආකෘතිය යි
3. HUB ආකෘතිය යි
4. ඇරිස්ටෝටල් ආකෘතිය යි
5. ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය යි

(45) පහත සඳහන් ප්‍රකාශ විමසා බලන්න.

A මුවින් නිකුත්වන වචන ක්ෂණයෙන් නැසීයයි.
B ලිඛිත සන්නිවේදනය මෙන් කල්තබා ගත නොහැක.
C ඇසුදේ සැනෙකින් අමතකන වී යා හැකිය.
D පෞද්ගලික බැඳීම් නොසලකා හැරීම
E සාක්ෂරතාව අවශ්‍ය වීම

මේ අතුරින් කථන සන්නිවේදනය හා වඩාත් සමීප වන්නේ,

1. AB හා D ය.
2. BC හා E ය.
3. CD හා E ය.
4. AC හා D ය.
5. AB හා C ය.

(46) ලොව ප්‍රථමයෙන් යමක් මුද්‍රණය කළ හැකි ක්‍රමවේද පිළිබඳ සොයා බැලුවේ,

1. ජර්මන් ජාතිකයින් ය
2. චීන ජාතිකයින් ය
3. ජපන් ජාතිකයින් ය
4. ග්‍රීක ජාතිකයින් ය
5. මිසර ජාතිකයින් ය

(47) **ප්‍රාථමික සමාජ** අවධියේ භාවිත නොවූ සන්නිවේදන ක්‍රමයක් සහිත වරණය වන්නේ,

1. දුම, කොළ අතු, හුව, අණබෙර, ගින්දර
2. ඉඟි, බිඟි, නලා, වර්ණ, බෙර, කොඩි
3. දුම, කොළ අතු, චිත්‍ර, අණ බෝලය, හුව
4. සංඥා, සංකේත, ඉඟිබිඟි, සිතියම්, හඬ
5. වෙස්මුහුණු, චිත්‍ර, බෙර, නලා, වර්ණ

(48) ''ජනතාව හා ඔවුන්ගේ ගැටලු'' නම් කෘතිය රචනා කරමින් සන්නිවේදන විෂය පෝෂණය කළ විද්වතා වූයේ,

1. චාල්ස් කුලි ය.
2. ජෝන්ඩුවී ය.
3. ජෝර්ජ් ගාබ්නර් ය.
4. කාල් හවුලන් ය.
5. කර්ට් ලෙවින් ය.

(49) සන්නිවේදනයේ **සන්දර්භය** යන්නෙන් අර්ථවත් වන්නේ,

1. සන්නිවේදනය සිදුවන වටපිටාවයි
2. සන්නිවේදනයේ ක්‍රියාවලියයි
3. සන්නිවේදන අරමුණයි
4. සන්නිවේදන සංකේතයි
5. සන්නිවේදනයේ බලයයි

(50) ඕපාදූප, කටකතා, නිර්නාමික පෙත්සම් හා කැළෑ පත්තර ආදිය ඇතුළත් සන්නිවේදන **ස්වරූපය** වන්නේ,

1. අවිධිමත් සන්නිවේදනය
2. විධිමත් සන්නිවේදනය
3. කණ්ඩායම් සන්නිවේදනය
4. අර්න්‍ය සන්නිවේදනය
5. වාචික සන්නිවේදනය

e තක්සලාව The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

29 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

12 ශ්‍රේණිය
Grade 12

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II
Communication and Media Studies - II

පැය තුනයි
Three hours

විභාග අංකය :- ..............................

සැලකිය යුතුයි :
- ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 20කි.

(01) සන්නිවේදනය අත්‍යවශ්‍ය මානවීය ක්‍රියාවලියකි. අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා සෑම පුද්ගලයෙකුම සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ.

i. සන්නිවේදනය පිළිබඳ **ෂැනොන් වීවර්ගේ** නිර්වචනය ලියන්න.
ii. සන්නිවේදනයේ කාර්ය **හතරක්** නම්කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. මූලික සන්නිවේදන ප්‍රභේද **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
iv. සන්නිවේදන ශාස්ත්‍රීය විෂයක් ලෙස අධ්‍යයනය කිරීමේ වැදගත්කම පිළිබඳව කරුණු හතරක් පදනම් කරගෙන රචනයක් ලියන්න.

(02) ලෝකයේ ඇති වූ විද්‍යා පුනරුදයත් කාර්මික විප්ලවයත් ජන සන්නිවේදනය බිහිවීමට හේතු විය.

i. ජන සන්නිවේදනයේ මූලික ලක්ෂණ හතරක් නම් කරන්න.
ii. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ අන්තර්ගත ලක්ෂණ හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. සන්නිවේදනයේ මූලික ස්වභාවයන් තුනක් වෙන් වෙන්ව පැහැදිලි කරන්න.
iv. සන්නිවේදනය විද්‍යාත්මක විෂයක් ලෙස ප්‍රචලිත කිරීමට දායක වූ පුද්ගලයින් හතර දෙනෙකු පිළිබඳ සඟරාවකට ලිපියක් ලියන්න.

(03) නව මාධ්‍ය භාවිතයේ දී සෑම දෙනෙකුට ම අන්තර් ජාලය පරිහරණය කිරීමට සිදුවේ.

i. නව මාධ්‍යයේ දැකිය හැකි ලක්ෂණ හතරක් නම් කරන්න.
ii. සමාජ මාධ්‍ය වර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. සමාජ මාධ්‍යයේ කාර්යභාරය පිළිබඳ කරුණු තුනක් විස්තර කරන්න.
iv. සමාජ මාධ්‍ය සමාජය වෙත කරණ යහපත් බලපෑම පිළිබඳ රචනයක් ලියන්න.

(04) i. **සාම්ප්‍රදායික** මාධ්‍ය හතරක් නම් කරන්න.
ii. ජනමාධ්‍යයේ කාර්යභාරය විද්වතුන් දෙදෙනෙකුගේ අදහස් ඇසුරින් පැහැදිලි කරන්න.
iii. විවිධ ජනමාධ්‍ය වර්ග සමාජයේ ක්‍රියාත්මක වන ආකාරය මාධ්‍ය තුනක් ඇසුරින් විස්තර කරන්න.
iv. සන්නිවේදන ක්‍රියාවලිය පැහැදිලි කර ගැනීමට මූලිකාංග උපකාරී වන ආකාරය කරුණු හතරක් ඇසුරින් උදාහරණ සහිතව විස්තර කරන්න.

(05) සන්නිවේදනය විවිධ අංග ලක්ෂණවලින් සමන්විත සංකීර්ණ ක්‍රියාවලියකි. එය අවබෝධ කර ගැනීමට ආකෘති උපකාරී වේ.

i. සන්නිවේදන ආකෘති හතරක් නම් කරන්න.

ii. සන්නිවේදන ක්‍රියාවලියක අඛණ්ඩව තොරතුරු හුවමාරු වන ආකාරය ආකෘතියක් ඇසුරු කරගෙන පැහැදිලි කරන්න.

iii. HUB ආකෘතියේ අන්තර්ගත අංග තුනක් විස්තරාත්මකව පැහැදිලි කරන්න.

iv. අථත්‍ය සන්නිවේදනය සමාජය තුළ ක්‍රියාත්මක වන ආකාරය උදාහරණ හතරක් මඟින් පැහැදිලි කරන්න.

(06) i. වාචික සන්නිවේදන නිපුණතා හතරක් නම් කරන්න.

ii. නිර්වාචික සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කර ඉන් දෙකක් උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. ලිඛිත සන්නිවේදනය යනු කුමක් දැයි හඳුන්වා පාසලක එය ඵලදායක ලෙස භාවිත කරන ආකාර හතරක් පැහැදිලි කරන්න.

iv. වර්තමානය වන විට සමාජ මාධ්‍යයේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් විවිධ ගැටළු මතු වී ඇත. උදාහරණ හතරක් ඇසුරින් පැහැදිලි කරන්න.

(07) i. ජන මාධ්‍ය බෙදා දැක්වෙන ප්‍රධාන ආකාර දෙක නම් කරන්න.

ii. පුවත්පතක දැකිය හැකි ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න.

iii. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය මඟින් සමාජ සංවර්ධනය සඳහා ඉටුකළ හැකි කාර්යන් තුනක් පැහැදිලි කරන්න.

iv. වර්තමාන ජන සමාජය වෙත වෙළඳ පොළ හා ජන මාධ්‍ය සිදුකරන බලපෑම පිළිබඳ කරුණු හතරක් පදනම් කරගෙන විශේෂාංග ලිපියක් සම්පාදනය කරන්න.

The National e-learning Portal for the General Education

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය - 2019

**12 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** **විසඳුම් පත්‍රය**

## I - පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. - 1 | 02. - 2 | 03. - 2 | 04. - 3 | 05. - 4 | 06. - 3 | 07. - 1 | 08. - 4 | 09. - 3 | 10. - 2 |
| 11. - 4 | 12. - 3 | 13. - 5 | 14. - 1 | 15. - 4 | 16. - 3 | 17. - 5 | 18. - 2 | 19. - 5 | 20. - 3 |
| 21. - 2 | 22. - 1 | 23. - 4 | 24. - 5 | 25. - 3 | 26. - 1 | 27. - 4 | 28. - 3 | 29. - 2 | 30. - 4 |
| 31. - 5 | 32. - 1 | 33. - 4 | 34. - 3 | 35. - 5 | 36. - 3 | 37. - 5 | 38. - 1 | 39. - 5 | 40. - 2 |
| 41. - 5 | 42. - 4 | 43. - 1 | 44. - 3 | 45. - 5 | 46. - 2 | 47. - 4 | 48. - 2 | 49. - 1 | 50. - 1 |

## II - පත්‍රය

(01) i. ''සන්නිවේදනය යනු යම් තැනකදී නිර්මාණය කරගත් හෝ තෝරා ගත් පණිවිඩයක් ඒ ආකායෙන් ම හෝ සමාන ලෙස වෙනත් තැනක දී ප්‍රතිනිර්මාණය කිරීමයි. (ලකුණු 2 යි)

ii. තොරතුරු සම්පාදනය
උපදෙස් සම්පාදනය / අධ්‍යාපනය
පෙළඹ වීම
විනෝදාස්වාද සම්පාදනය
සුපරීක්ෂණය
අර්ථකථනය
(නම් කිරීමට 1/2 × 4 =2, පැහැදිලි කිරීම 1 × 2 =2)

iii. අන්තවර්තී පුද්ගල සන්නිවේදනය
අන්තර්පුද්ගල සන්නිවේදනය
සමූහ සන්නිවේදනය
මහජන සන්නිවේදනය
ජන සන්නිවේදනය
ජන සන්නිවේදනය
අතත්‍ය සන්නිවේදනය (ලකුණු 2 × 3 =6)

iv.
* ශාස්ත්‍රීයක් විෂයක් ලෙස අධ්‍යයනයේ පසුබිම
* එහි ආරම්භය
* විකාශනය
* වැදගත්කම
* ඊට දායක වූ විද්වතුන් (ලකුණු 2 × 4 =8)

02. i. වෘත්තීය සන්නිවේදකයින් සිටීම
දියුණු තාක්ෂණික මෙවලම් භාවිත කිරීම
බහු විධ දොරටු පාලකයින් සිටීම
විෂම ජාතික ග්‍රහකයන් සිටීම
වෙළඳපොළ මත නිර්මාණය වීම (ආදී කරුණ ලකුණු 1/2 4=2)

ii.
* තම සිත අභ්‍යන්තරයේ සිදුවන සන්නිවේදනයක් වීම
* පුද්ගල මතකය හා සම්බන්ධ වේ.
* සංජානනයන් අර්ථකථනයකර ගත හැකි වීඹ
* පංචේන්ද්‍රියට දැනෙන උත්තේජන මත ප්‍රතිචාර දැක්වීම
* තීරණ ගැනීමට ඉවහල් වේ.
* ආත්ම භාෂණ ක්‍රියාවලියක් වීම (නම් කිරීම ලකුණු 1/2 × 4 = 2,
විස්තර කිරීම 1 × 2 =2)

iii.
* අරමුණ සහගත වීම
* සංකේතාත්මක වීම

The National e-learning Portal for The General Education

* සන්දර්භයානුගත වීම
* ක්‍රියාපටිපාටියක් වීම
* විවිධාකාර වීම (ලකුණු 2 × 3 =6)

iv.
* විල්බර් ශ්‍රාම්
* ඩැනියල් ලර්නර්
* මාෂ් සේතුං
* එවරට් එම් රොජර්ස්
* හැරල්ඩ් ඩී ලැස්වෙල් (ලකුණු 2 × 4 = 8)

03. i.
* සංඛ්‍යාංක කරණය
* ජාලගතකරණය
* අන්තර්ක්‍රියාකාරීත්වය
* අධිපාඨනීයත්වය
* ස්වයංක්‍රියාකාරීත්වය (ලකුණු 1/2 × 4 =2)

ii.
Face book
Twitter
Utube (ලකුණු 2 × 2 =4)

iii.
* අන්තර්ජාලය ඔස්සේ විවිධ තොරතුරු නිර්මාණය බෙදා හදා ගත හැකි වීම
* තොරතුරු සාකච්ඡා කිරීම හා වෙනස් කිරීමට හැකි වීම
* දැනුම ගබඩා කිරීමේ පහසුව හා හුවමාරු කළ හැකි වීම
* පුද්ගලයින් සංවිධානය කළ හැකි වීම
* බොහෝ විට කිසිදු වාරණයකින් තොරව තොරතුරු සමාජ ගත කිරීමට අධිමාන්ත ඉඩකඩක් පැවතීම
* පවතින සමාජ මත වෙනස් කිරීමට හැකි වීම
* පුද්ගලයින් වැඩි පිරිසකට ආම න්ත්‍රණය කළ හැකි වීම (ලකුණු 2 × 3 =6)

iv.
* ග්‍රාහක ක්ෂෙත්‍රය කැමති ලෙස පරිහරණය කිරීම
* පරිහරණය කරන කෙනාට සංස්කරණය කළ හැකි වීම
* ක්ෂණික වීම
* දැනුම හුවමාරු කරගත හැකි වීම
* එක් මාධ්‍යයකින් තවත් මාධ්‍යයකට යා හැකි වීම
* අන්තර්ගතය නිර්මාණය කළ හැකි වීම (ලකුණු 2 × 4 =8)

04. i.
* ජන කතා
* ශාන්ති කර්ම හා යාතු කර්ම
* ජන කවි
* ගැමි නාටක (ලකුණු 1/2 × 4 =2)

ii. විල්බර් ශ්‍රාම්
* ආරක්ෂකයෙකුගේ භූමිකාව
* සාකච්ඡා මණ්ඩපයක භූමිකාව
* ගුරුවරයෙකුගේ භූමිකාව

හැරල්ඩ් ලැස්වෙල් (ලකුණු 2 × 2 =4)
* සුපරීක්ෂණය
* ප්‍රවෘත්ති ලොව පුරා බෙදා හැරීම
* ප්‍රේක්ෂක මතය හා අදහස් හැඩගැස්වීම

iii.
* පුවත් පත් * ගුවන් විදුලිය * රූපවාහිනිය * සිනමාව

iv.
* සන්දේශය * නාලිකාව * ග්‍රාහකයා * විකේතකරණය
* ප්‍රතිපෝෂණය * ඝෝෂා/ බාධක * අත්දැකීම් පසුතලය * සන්දර්භය
* බලපෑම (ලකුණු 2 × 4 =8)

05. i.
* අරිස්ටෝටල් ආකෘතිය * හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතිය
* විල්බර්ශ්‍රාම් ආකෘතිය * ක්ලෝඩ් ෂැනොන් සහ වොරන් වීවර් ආකෘතිය
* HUB ආකෘතිය (ලකුණු 1/2 × 4 =2)

The National e-Learning Portal for The General Education

ii. සන්නිවේදක විසින් ලබා දෙන පණිවිඩය ග්‍රාහකයා විසින් ලබා ගෙන පෙරළා ඔහු සන්නිවේදකයෙකු වශයෙන් නැවත නැවත ප්‍රතිචාර දක්වන ආකාරයයි. (ශ්‍රාම් ඔස්ගුඩ් හෝ ශ්‍රාම්ගේ චක්‍රීය ආකෘතිය) (ලකුණු 1 × 4 =4)

iii.
* සන්නිවේදකයෝ
* දොරටුපාලකයෝ
* නියාමකයෝ
* ග්‍රාහකයෝ
* සංඥා
* ජනමාධ්‍ය
* පෙරහණ
* බලපෑම (ලකුණු 2 × 3 =6)

iv. අන්තර්ජාලය ඇසුරින් ගොඩනැගීම
විද්‍යුත් තැපැල
වීඩියෝ සම්මන්ත්‍රණ
සමාජ ජාල වෙබ් අඩවි
මාර්ගගත කතා බහ (ලකුණු 2 × 4 =8)

06. i.
* වාග් කෝෂය පුළුල් කර ගැනීම
* තමා සතු අදහස් හා තොරතුරු ඇතුළත් දැනුම වර්ධනය කර ගැනීම
* පෙර සූදානම
* ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කිරීම
* යෝග්‍ය භාෂා භාවිතය
* වගකීමෙන් යුතුව වචන භාවිතය (ලකුණු 1/2 × 4 =2)

ii.
* සංඥා භාෂාව - සිනහව, ඉඟිබිඟි
* අංග චලන - අත වැනීම, හිස සෙලවීම
* පාර භාෂාව - ඇඳුම් පැළඳුම්
* බාහිර පෙනුම - ඉරියව් (ලකුණු 1/2 x 4 =2, 1 x 2 =2)

iii. ලිඛිත මාදිලියකින් තොරතුරු ඉදිරිපත් කිරීම ලිඛිත සන්නිවේදනයයි. (ලකුණු 2 × 1=2)
* දැන්වීම් පුවරුව සඳහා
* පුවත්පත් සඟරා ආදිය සඳහා
* දෙමාපියන් දැනුවත් කිරීම සඳහා
* රාජකාරි ලිපි සඳහා
* ස්ථාන නාමකරණය සඳහා (ලකුණු 1 × 4 = 4)

iv.
* මානසික අවපීඩනය හා කණස්සල්ල
* ගැඹුරු මහස් සාමාජීය ප්‍රතිඵල ඇති කිරීම
* ග්‍රාහමකයන් ලබැදියන් වී සිටීම
* පෞද්ගලිකත්වය පිළිබඳ ගැටලු මතු වීම
* අවසරයකින් තොරව පරිශීලකයින්ගේ ගිණුම්වලට ඇතුළු වීම
* සයිබර් හිරිහැර
* ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමු වීම (ලකුණු 2 × 4 =8)

07. i. මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය (ලකුණු 1 × 2 =2)

ii.
* මුද්‍රිත හා මාර්ගගත මුද්‍රණ නිකුත් වීම
* නියමිත කාල පරාසයක නිකුත් කිරීම
* කාලීන බව හා නැවුම් බවකින් යුතු වීම
* කාලාන්තරයක් තිස්සේ පැවතීම
* ජනමත ගොඩනැගීම
* සාමාන්‍ය සාක්ෂරතාවය ඇති අයෙකුට වුවද කියවිය හැකි වීම (ලකුණු 2 × 2 =4)

iii.
* තොරතුරු සමාජයක් නිර්මාණය කිරීම
* දැනුම වර්ධනය කිරීම
* තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය දියුණු කිරීම
* මාධ්‍ය අචාර ධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධය
* මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය (ලකුණු 2 × 3 =6)

iv.
* චින්තන රටවන්ට බලපෑම් කිරීම
* නවීකරණයට බලපෑම් කිරීම
* පරිභෝජන සංස්කෘතියට බලපෑම් ඇතිකිරීම
* ගෘහස්ථ සාමය සහ සහජීවනයට බලපෑම් ඇති කිරීම
* සමස්ත සංස්කෘතියට සිදුකරන බලපෑම (ලකුණු 2 × 4 =8)

e-thaksalawa The National e-learning Portal for The General Education